**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

**මාතලේ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 23 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2010 මැය 04 දින ද විගණනයට ඉදිරිපත් කරන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ ඇතුළත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දඹුල්ල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1:3:1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයට අදාළ අවස්ථා 18 කදී අයකරන ලද රු.72,231 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.946,386 ක වියදම් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා වර්ෂයේ වියදම සහ වියදම් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) සභාව සතු ඉඩම් කැබලි 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ වල දුන්වට්ටම් රු.388 ක හා ලද වට්ටම් රු.138,286 ක් අදාළ වර්ෂ තුලදී ආදායම් හා වියදම් ගිණුමට ගැලපීමෙන් තොරව ශේෂ පත්‍රයෙහි පෙන්නුම් කර තිබුණි.

(ඊ) අවස්ථා 09 කදී ලැබුණු ආදායම් රු.1,569,745 ක මුදල වර්ෂයේ ආදායමට ගත යුතු වුවද තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(උ) දඹුල්ල බස්නැවතුම්පල ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතු ණය වාරික හා පොලී මුදල් වල එකතුව වූ රු.75,393,722 ක මුදල් ගිණුම්ගත නොකිරීමෙන්, වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඌ) 2010 වර්ෂය තුල මිළදීගෙන තිබූ මයික්‍රෝෆෝනයේ වටිනාකම වූ රු.890 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(එ) පසුගිය වර්ෂ වලට අදාළ ගනුදෙනු සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත්, 2009 වර්ෂයට අදාළව අවස්ථා 04 කදි ගෙවා තිබූ රු.146,237 ක ඉන්ධන බිල්පත් වල වටිනාකම, සමුච්චිත අරමුදලට ගැලපුම් නොකර වර්ෂයේ වියදමට ගෙන තිබුණි.

(ඒ). අවස්ථා 02 කදී ලබාදී තිබූ රු.23,106 ක් වූ අත්තිකාරම් , ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1:3:2 නොසැසඳු පාලන ගිණුම්
--------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.60,077,161 ක් ක් වූ අතර උපයෝගී ලේඛන /වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.110,981,823 ක් විය.

1:3:3 බැංකු සැසඳුම්
---------------

(අ) වසර 20 කට වඩා අධික කාලයක සිට උපලබ්ධි නොවූ තැන්පතු රු.19,574 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.51,750 ක් වූ අගරු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 හා 486 හි සඳහන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ වල වටිනාකම රු. 300,256,871 ක් විය.

1:3:5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 13 කට පිළිතුරු සපයා නොතිබූ අතර එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.39,513,287 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.182,476,446 ක් වූ ගණනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) ලේඛන පැවැත්වීම

පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි.

(i). ණයහිමි ලේඛනය

(ii). ණයගැති ලේඛනය

1.3.6 අනුකූල නොවීම්

පහත දැක්වෙන නිති,රීති,රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) <u>1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන)රීති මාලාව</u> | |
| 99 රීතිය | සියලුම ගෙවීම් වවුචර් සහතික කිරීම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද්දේ නම් උපසභාපතිවරයා විසින් හෝ කළ හැකි වුවත්,රු.349,908 ක් වටිනාකමැති ගෙවීම් වවුචර් 06 ක් සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | දෙන ලද අත්තිකරම් අදාළ කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් 2007 වර්ෂයේ අවස්ථා 02 කදී බාහිර පාර්ශවයන් වෙත දෙනු ලැබු රු.14,375 ක අතතිකාරම් හා 2006 වර්ෂයේ ඉතිරිකරගත් නිවාඩු වෙනුවෙන් 2007 වර්ෂයේදී නිළධාරින්ට ගෙවා තිබූ රු.293,850 ක් පළාත් පාලන කොමසාරිස් වෙතින් 2010 සැප්තැම්බර් 30 දින වන විටත් පියවාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළග මාසයේ 15 වෙනි දිනට පෙර විණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාව සතු වාහන 06 ක 2010 වර්ෂයට අදාළ ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) <u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පිඑස් 437 | රජයට අයත් වාහන වල රක්ෂණ ආවරණ සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදල හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් ලබාගත යුතු වුවත්, සභාව සතු වාහන 03 ක රක්ෂණ ආවරණ පෞද්ගලික රක්ෂණ සමාගමකින් ලබාගෙන තිබුණි. |

(ඈ) <u>මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස්ගේ අංක 2001 ජුලි 17 දින 01/2001 දරන චක්‍රලේඛ</u>

රු.18,400ක් වැය කර ප්ලාස්ටික් පුටු 23 ක් මිළදීගෙන තිබූ නමුත් චක්‍රලේඛය ප්‍රකාරව 5% පිරිවැටුම් බදු අඩුකරගෙන නොතිබුණි.

(ඉ) <u>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ</u>

| | |
|---|---|
| (i) 1:2:1(ඇ) ඡේදය | දඹුල්ල බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණය 2008 සැප්තැම්බර් 01 දින සිට 2009 අගෝස්තු 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පිරිසිදු කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාතකරුවෙකුට භාරදී තිබුණි. කොන්ත්‍රාත් කාලසීමාව නිමවීමෙන් පසු නැවත සේවාව සපයා ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගත යුතු වුවත් එසේ කටයුතු නොකිරීමෙන් තොරව පලමු කොන්ත්‍රාත්කරුටම දිගින් දිගටම සේවාව සැපයීමට ඉඩහැර ගෙවීම් කරමින් පැවතුණි. මේ නිසා සුදුසුකම්ලත් උන්නදුවක් දක්වන වෙනත් පාර්ශවයන්ට අවස්ථාව ඇහිරී ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියේ අරමුණුද ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,532,920 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,215,187 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i)වරිපනම් හා බදු | 6,000 | 3,908 | 2,092 | 5,800 | 2,749 | 3,051 |
| (ii) බදු කුලී | 7,495 | 5,880 | 1,615 | 7,406 | 3,137 | 4,263 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5,370 | 3,905 | 1,465 | 5,846 | 4,082 | 1,764 |
| (iv) වෙනත් ආදායම් | 34,600 | 27,729 | 6,871 | 98,694 | 29,491 | 69,204 |

#### 2:2:2 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තියේ විධිවිධාන අනුව හිඟහිටි වරිපනම් බදු අදාළ දේපල තහනමට ගෙන විකිණීම මගින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, 2010 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.2,896,218 ක් ඒ පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:3 උසාවි දඩ මුදල්
------------------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.5,213,059 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු
-------------

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.6,027,300 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2:2:5 අනෙකුත් හිඟ ආදායම්
----------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති මාලාව 5 (3), 5 (6)රීතියට අනුව, සභාවට අයවිය යුතු ආදායම් හා වෙනත් ගාස්තු නියම කාලසීමාව තුලදී එකතු කරන බවට හා ඒවා ගිණුම් ගත කොට දක්වනු ලබන බව සහතික කිරීම සභාපතිවරයාගේ වගකිම වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු.260,870 ක් වු බදු කුලි, රු.309,050 ක්වූ බලපත්‍ර ගාස්තු රු.6,027.300 ක්වූ වරෙන්තු ගාස්තු රු.5,213,059ක්වූ දඩ මුදල් හා රු.12,943,049ක්වූ වෙනත් ආදායම්ද 2010 දෙසැම්බර්31 දින වන විට අය නොවී පැවතුණි.

2.2:6 ආදාහනාගාර සේවා ගාස්තු
---------------------------------

ආදාහනාගාරයේ සේවය ලබාදිම සඳහා ගාස්තු ලෙස රු.636,000 ක් සහ මෘත ශාරිර අළුතැන්පත් කිරිම සඳහා ස්ථානයක් වෙන් කිරීමේ ගාස්තු ලෙස රු.600,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ඉන් කිසිදු ආදායමක් ලබාගෙන නොතිබුණි.

2:3 වියදම් ව්‍යුහය
--------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත රු. '000 | 2010 තථ්‍ය රු. '000 | 2010 විචලනය රු '000 | 2009 අයවැයගත රු. '000 | 2009 තථ්‍ය රු. '000 | 2009 විචලනය රු '000 |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තනවියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 43,647 | 23,222 | 20,425 | 44,031 | 21.000 | 23,031 |
| අනෙකුත් | 27,112 | 8,173 | 18,939 | 28,872 | 9,589 | 19,283 |
| උප එකතුව | 70,759 | 31,395 | 39,364 | 72,903 | 30,589 | 42,314 |
| ප්‍රාග්ධන වියදම | 94,832 | 94.012 | 820 | 95,623 | 29,394 | 66,229 |
| මුළු එකතුව | 165.591 | 125,407 | 40,184 | 168,526 | 59,983 | 108,543 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතීය | 33 | 18 |
| ප්‍රාථමික | 42 | 38 |
| වෙනත්(අනියම්/තාවකාලික) | - | 31 |

## 2.5 වත්කම් කළමනාකරණය

### 2:5:1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති රු.15,215,538 ක භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

### 2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂ වල එකතුව රු.1,685,713 ක්වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු.108,602 ක් විය.

2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු..1,816,121 ක් විය.

2.5.4 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගයමත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු255,185,239 ක් විය.

2.6 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(i)(i)වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබානොගෙන යුතු අදාළව සේවකයින් 11 දෙනෙකු පත්කර සඳහා වැටුප් වශයෙන් රු.1,550,647 ක මුදලක් ගෙවා තිබුණි

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තියෙන් නීතිමය ප්‍රතිපාදන සලසා නොමැති කාරණයක් වූ සුභ පැතුම්පත් මුද්‍රණය හා කාර්ය මණ්ඩලයේ නිළධාරින් සඳහා නිල ඇඳුම් මිළදී ගැනීම සඳහා රු.41,850 ක් ද පුවක් අත්තාවල ප්‍රජාශාලාවට පුටු 23 ක් මිළදී ගැනීම සඳහා රු.18,400 ක් ද ගෙවා තිබුණි.

(ඇ). දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු වාර්තාව අනුව බැකෝ යන්ත්‍ර සඳහා ඉන්ධන ලීටර් 8 ක්ද සමඟ පැයකට රු.800 ක් ද ඉන්ධන නොසැපයූ විට පැයකට රු.1,400 ක්ද නියම කර ඇතත් අටුබැද්දියාව පොදු ලිඳ කැපීම සඳහා එම මිළ ගණන් සැලකිල්ලට නොගෙන පැයකට රු.5,000 බැගින් පැය 08 ක් සඳහා රු.40,000 ක් ගෙවා තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොම්පෝස්ට් ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට අවශ්‍ය මූලික පුහුණුව තුන්මසක කාලයකදි ලබාදෙන බවට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක සභාපති වෙත දන්වා තිබුණද සභාවට මේ සඳහා ඉඩමක් නොමැතිකම නිසා කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කිරීම දිගින් දිගටම පැහැර හැර තිබුණි.

(ආ) වාර්ෂික අයවැය ලේඛනය අනුව සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාරික ස්ථාන සඳහා එම ස්ථාන වල ප්‍රමාණය හා ස්වභාවය අනුව භාණ්ඩ ගතකොට ගිනිනිවීමේ පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා ගාස්තු ලෙස රු.10,195,000 ක් ලබාගැනීම පිණිස ඇස්තමේන්තු කර තිබුණත් එම ආදායම් ලබාගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ගබඩා තොග අයිතම 12 ක් පිළිබඳව කරන ලද භෞතික පරීක්ෂණයේදී,අයිතම 04 ක රු.2,900 ක අතිරික්තයක්ද, අයිතම 04 ක රු.15,175 ක ඌණතාවයක්ද නිරීක්ෂණය විය.

2:8 හඳුනාගන්නා ලද පාඩු

------------------------

සභාව මගින් පවත්වාගෙන යන සිමෙන්ති බ්ලෝක්ගල් නිෂ්පාදන ව්‍යාපෘතියේ 2010 පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනය කර තිබූ බ්ලොක්ගල් සංඛ්‍යාව 9000 ක් වූ අතර ඒ සඳහා දරා තිබූ පිරිවැය රු.247,398 ක් විය.ඒ අනුව එක් ගලක ඒකක පිරිවැය රු.27.49 ක් පමණක් වී තිබුණි. බ්ලොක්ගලක විකුණුම් මිල රු.20 ක් ලෙස මිල නියම කර කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීම නිසා එක් රු.7.49 බැගින් රු.67,398 ක පාඩුවක් සිදුවී තිබුණි.

2:9 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

ඉදිකිරීම්

-----------

(අ) . ආදාහනාගාරය වටා බැම්ම බැදීම.

---------------------------------------

(i). ආදාහනාගාරය වටා බැම්ම බැදිම 1 අධියර යටතේ අනුමත ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 03 අනුව අත්තිවාරම් බැම්ම ඉදිකිරීම සඳහා මී. 0.06 ක් ගැඹුරට කානු කැපිය යුතු අතර, මිණුම් වාර්තාව අනුව පස් ඝන මීටර් 31.52 ක් ඉවත් කිරීම වෙනුවෙන් රු.18,597 ක් ගෙවා තිබුණද, කානුවේ ගැඹුර මී. 045 ක් පමණක් වීම නිසා ඉවත් කර

තිබූ පස් ප්‍රමාණය ඝණ මී.23.64 පමණක් වූයෙන් රු.4,649 ක වැඩිපුර ගෙවා තිබුණි.තවද විෂය නිමවුම් වාර්තාවේ වැඩ විෂය අංක 04 අනුව කලුගල් බැම්මේ පතුලට කොන්ක්‍රීට් පාදම යෙදීම වෙනුවෙන් ඝණ මීටර් 1 කට රු.12,170 බැගින් ඝණ මීටර් 7.85 ක් සඳහා රු.95,534 ක මුදලක් ගෙවා තිබුණද , කොන්ක්‍රීට් පාදම යෙදීමෙන් තොරව තාප්පය ඉදිකිරීම නිසා එකී මුදලින් සභා අරමුදලට පාඩු සිදුවී තිබුණි.

(ii). ආදාහනාගාරය වටා බැම්ම බැදීම -2 වන අදියර යටතේ ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂය අංක 02 අනුව කල්ගල් බැම්මේ කයිරුව කපරාරු කිරීම වෙනුවෙන් රු.9,171ක් ගෙවා තිබූ නමුත් කයිරුව කපරාරු කර නොතිබූ බැවින් එකී මුදලින් සභා අරමුදලට පාඩු සිදුවී තිබුණි.එසේම විෂය අංක 05 අනුව තාප්පයේ හා කුලුණුවල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් රු.26,711 ක් ගෙවා තිබුණද, තීන්ත ආලේප කර නොතිබුණි. එමගින් සභා අරමුදලට සිදුවූ පාඩුව රු.35,882 ක් විය.

(iii). ආදාහනාගාරයට පිවිසෙන ගේට්ටුවේ යකඩ පට්ටම් හා බටවල මළබැදී තිබූ අතර තාප්පයේ එක් කුළුනක කපරාරුවේ කොටසක් ගැලවී තිබුණි.

(ආ). කොට්ටවෙල පාර කොටසක් ප්‍රතිසංස්කරණය කිරීම
---------------------------------------------------------

(i). කොට්ටවෙල පාර කොටසක් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් වැඩ විෂය අංක 04 අනුව මාර්ගයේ ඇතිරීම සඳහා බොරළු ඝණ මී.171 ක් සපයා ගොනු කිරීම වෙනුවෙන් රු.58,054 ක් ගෙවා තිබුණද ගොනු කරන ලද බොරළු වල මිනුම් පරීක්ෂණ දිනය හා ප්‍රමාණයන් වෙන වෙනම මිනුම් පත්‍රවල දක්වා නොතිබුණි. එසේම වැඩ විෂය අංක 05 අනුව බොරළු ඝන.මී.171 ක් ප්‍රවාහනය කිරීම වෙනුවෙන රු.59,123 ක් ගෙවා තිබුණද බොරළු ප්‍රවාහනය කරන ලද්දේ කුමන සථානයකින්ද එම ස්ථානයට ඇති දුර ප්‍රමාණය යන විස්තර කර නොතිබුණි.

(ii). කොන්ත්‍රාත්තුව ඉටුකිරීමෙන් පසුව, එම මාර්ගයේම ස්ථාන දෙකක වෙනත් ප්‍රතිපාදන යටතේ රු.480,000 ක් හා රු.500,000 ක් වැය කර කොන්කට් කිරීම සහ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සිදුකර තිබූ බැවින් එම කොටස්වලට බොරළු ඇතිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් දරා තිබූ රු.200,000 ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඇ). දඹුල්ල බස්නැවතුම්පොළ වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම
---------------------------------------------------------------

(i). 2009 සැප්තැම්බර් 01 දිනපුද්ගලික ආයතනයක් සමඟ එළඹී කොන්ත්‍රාත් ගිවිසුම අනුව දඹුල්ල බස්නැවතුම්පොල වෙළඳ සංකීර්ණය ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා සහ

එකතුවන කසල බැහැර කිරීම සඳහා ගෙවීමේ පදනම මත ගිවිසුම් ගත වී තිබූ අතර එම ගිවිසුමේ 09 කොන්දේසිය අනුව එකතුවන කසල බැහැර කිරීම කොන්ත්‍රාත් පාර්ශවය විසින් සිදුකළ යුතු වුවත් එම එකගතාවයට පටහැනිව එකී සේවාව සඳහා රු.3,000 ක මාසික ගාස්තුවක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන කසල ඉවත් කිරීම සභාව විසින් ඉටුකර තිබුණි. දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මිල ගණන් අනුව දුර ප්‍රමාණය අනුව ට්‍රැක්ටැය සඳහා කුලී ලෙස දිනකට රු.1,124 බැගින් මාසයක් සඳහා රු.33,720 ක් අයකර ගත යුතුව තිබුණත් ලබාගෙන තිබුණේ මසකට රු.3,000 ක් පමණි.

(ii) මෙම ආයතනය තනිපුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර තිබුණද, 2010 වර්ෂයේ සේවාව සැලසීම වෙනුවෙන් ගාස්තුව ලබාගැනීම සඳහා ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් විවිධ පුද්ගලයින් හතර දෙනෙකුගේ අත්සන් යොදා බිල්පත් ඉදිරිපත් කර තිබුණි.

## 3 පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය